# රත්නපුර ප්‍රාදේශිය සභාවේ 2022.01.19 වන දින මහා සභා රැස්වීම් වාර්තාව

රත්නපුර ප්‍රාදේශිය සභාවේ මහා සභා රැස්වීම 2022.01.19 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රත්නපුර ප්‍රාදේශිය සභාවේ සභා රැස්වීම් ශාලාවේදී පැවැත්විණි.

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01. | ඩබ්ලිව්.ඩී.සුදත් දිසානායක මහතා | ගරු සභාපති |
| 02. | ජී.ජී.ජානක පුෂ්ප කුමාර මහතා | ගරු උප සභාපති |
| 03. | ටී.ප්‍රේමතිලක මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 04. | එන්.විජය ශ්‍රී ශාන්ත මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 05. | ජී.එච්.රංජිත් ධර්මකීර්ති මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 06. | අයි.වී.අඛිල රෝෂන් ලක්මාල් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 07. | කේ.රණවක කළුආරච්චි මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 08. | ඊ.කේ.ජී.ප්‍රියන්ත පෙරේරා මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 09. | බී.ප්‍රියන්ත මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 10 | ඒ.එම්.සමන් පාලිත විජේරත්න මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 11. | එම්.ඒ.ඩික්සන් ජයතිලක මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 12. | කේ.නිරෝෂන් ලක්මාල් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 13. | ආර්.බී.නාලක සුදත් ශ්‍රී හේමපාල මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 14. | ඒ.එම්.නිලන්ති මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 15. | කේ.ඒ.ජයරත්න මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 16. | පී.වී.ඉන්දික ලක්ෂ්මන් විතාරම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 17. | ජී.වී.අනුෂ විරාජ් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 18. | එල්.එම්.තමරා සුභාෂිණී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 19. | කේ.වී.කමනි සේනාධීර මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 20. | ගෝපාල් තම්බිරාජා මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 21. | බී.ඒ.ලලිත් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 22. | පී.රොහාන් ශ්‍රියන්ත කුමාර මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 23. | මංජුල ශ්‍රීලාල් බී ගමගේ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 24. | ඕ.කේ.සුගත් ජයවික්‍රම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 25. | ඒ.දොන්.නිශාන් දමිත්අල්ගම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 26. | රාමසාමි මෝහන සුන්දරම් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 27. | ජී.ජී.ලිලානි චන්ද්‍රතිලක මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 28. | යූ.කේ.නන්දාවතී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 29. | ආර්.ඒ.පත්මා නන්දනී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 30. | එම්.වජිරා නන්දනී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

**සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා/ තුමියන්ලා**

| | | |
|---|---|---|
| 01. | පී.වී.ඉසුරු ජයලත් විතාරණ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 02. | කේ.ජී. නිහාල් අමරසිංහ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 03. | පී.උදය කුමාර් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 04. | ඩී.නිලන්ති දීපිකා යසරත්න මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 05. | ජී.අනුර ප්‍රභාත් අමරවංශ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 06. | ටී.ජී.ඉන්ද්‍රාණි මැණිකේ මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

**සහභාගී වූ නිලධාරීන් :-**

01.කේ.අජිත් දයානන්ද මහතා - ලේකම්

02.ජී.එච්.අයි.ඩී.ආරියමිත්‍ර මහත්මිය - සංවර්ධන නිලධාර

**01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2021.12.10 වන දින මහා සභා වාර්තාව , 2021.12.30 විශේෂ සභා වාර්තාව, 2022.01.10 වන දින විශේෂ සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී නාලක සුදත් ශ්‍රී මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**03.ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන සභාව ඉදිරියේ තැබීම.**

i. **රත්නපුර ප්‍රාදේශිය සභාවේ ගරු උප සභාපති ජී.ජී.ජානක පුෂ්පකුමාර මහතා විසින් 2022.01.19 දින ඉදිරි පත් කරන ලද "විසල් ජල යෝජනා ක්‍රමය සඳහා පළුදු කරන ලද මාර්ග පිළිසකර කිරීම." නැමැති ලිපිය.**

**04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න**

නැත

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා**

i. 2022 වර්ෂය සඳහා මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව ,කාර්මික සේවා කාරක සභාව,පරිසරය හා පහසුකම් කාරක සභාව සඳහා කමිටු සාමාජිකයින් පත් කර ගැනීම සඳහා සාමාජිකයින් පත්කර ගැනීම කළ යුතු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, පහත පරිදි කමිටු සාමාජිකයින් පත්කරන ලදී.

- **මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව**

ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතා
ගරු මන්ත්‍රී රංජිත් ධර්මකීර්ති මහතා
ගරු මන්ත්‍රී ගෝපාල් තම්බිරාජා මහතා
ගරු මන්ත්‍රී කමනි සේනාධිර මහත්මිය
ගරු මන්ත්‍රී ඊ.කේ.ජී.ප්‍රියන්ත පෙරේරා මහතා
**සුදුසු බව ගරු මන්ත්‍රී කේ.ඒ ජයරත්න මහතා විසින් යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු මන්ත්‍රී සමන් පාලිත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

- **නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව**

ගරු උප සභාපති ජී.ජී.ජානක පුෂ්පකුමාර මහතා
ගරු මන්ත්‍රී කේ.ඒ.ජයරත්න මහතා
ගරු මන්ත්‍රී ඩික්සන් ජයතිලක මහතා
ගරු මන්ත්‍රී තමරා සුභාෂිණි කරුණාරත්න මහත්මිය
ගරු මන්ත්‍රී වජිරා නන්දනී මහත්මිය
ගරු මන්ත්‍රී සුගත් ජයවික්‍රම මහතා **සුදුසු බව ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී ලලිත් බෝතුංග ආරච්චි මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

- **කාර්මික සේවා කාරක සභාව**

ගර මන්ත්‍රී අඛිල රෝෂන් ලක්මාල් මහතා
ගරු මන්ත්‍රී නාලක සුදත් ශ්‍රී හේමපාල මහතා
ගරු මන්ත්‍රී මෝහන සුන්දරම් මහතා
ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත කුමාර් මහතා
ගරු මන්ත්‍රී සමන් පාලිත විජේරත්න මහතා **සුදුසු බව ගරු මන්ත්‍රී රණවක කළු ආරච්චි මහතා විසින් යෝජනි කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික ලක්ෂ්මන් විතාරම මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

- **පරිසරය හා පහසුකම් කාරක සභාව**

ගරු මන්ත්‍රී රණවක කළුආරච්චි මහතා
ගරු මන්ත්‍රී බී.ප්‍රියන්ත මහතා

ගරු මන්ත්‍රී ලීලානි චන්ද්‍රතිලක මහතා
ගරු මන්ත්‍රී දමිත් අල්ගම මහතා
ගරු මන්ත්‍රී නිරෝෂන් ලක්මාල් මහතා **සුදුසු බව ගරු මන්ත්‍රී රංජිත් ධර්මකීර්ති මහතා විසින් යෝජනා කරන ලදුව, ගරු මන්ත්‍රී නාලක සුදත් ශ්‍රී හේමපාල මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත කරන ලදී.**

ii. 2022 වර්ෂයට ගල්ලෑල්ල, ගිලීමලේ පුස්තකාල සඳහා උපදේශන කමිටු පත්කර ගැනීම.( ගරු මන්ත්‍රීතුමන්ලා, ප්‍රදේශයේ ප්‍රභූන්, ආගමික නායකයින් ඇතුලත් වන පරිදි) සිදුකළ යුතු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී . ඒ අනුව පහත පරිදි කමිටු සාමාජිකයින් පත්කරන ලදී.

- **ගිලීමලේ පුස්තකාල උපදේශන කමිටුව**

ගරු මන්ත්‍රී සමන් පාලිත මහතා
ගරු මන්ත්‍රී ලලිත් බෝතුංග ආරච්චි මහතා
ගරු මන්ත්‍රී කේ.ඒ.ජයරත්න මහතා
ගිලී මලේ රජමහා විහාරාධිපතින් වහන්සේ
ගිලීමලේ සමනල විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පතිතුමා
විශ්‍රාමලත් ආයුර්වේද වෛද්‍ය දසනායක මැණිකේ මහත්මිය

- **ගල්ලෑල්ල පුස්තකාල උපදේශන කමිටුව**

**ගරු මන්ත්‍රී රංජිත් ධර්මකීර්ති මහතා**
**ගරු මන්ත්‍රී සුගත් ජයවික්‍රම මහතා**
**ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රීයන්ත කුමාර් මහතා**
**ගල්ලෑල්ල විහාරාධිපති ස්වාමීන් වහන්සේ**
**සුදුසු බව ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී නාලක සුදත් ශ්‍රී හේමපාල මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත කරන ලදී.**

iii.රත්නපුර ප්‍රාදේශීය සභාව විසින් සකස් කරන ලද 2022 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැළැස්ම අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත කරන ලදී.

iv.රත්නපුර ප්‍රාදේශිය සභාවේ 2021.12.31න් අවසන් වූ මුදල් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදුකිරීම සඳහා නිර්දේශිත කමිටුවට පහත පරිදි නිර්දේශ කර ඇති අතර, එය අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී ගෝපාල් තම්බිරාජා මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත කරන ලදී.

- සුරේඛා දමයන්ති මහත්මිය - සංවර්ධන නිලධාරී - කමිටු සභාපති
- ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතා - කමිටු සාමාජික
- ගරු මන්ත්‍රී ටී.පේමතිලක මහතා - කමිටු සාමාජික
- ඒ.නිම්මි සමුද්ධිකා මිය - සංවර්ධන නිලධාරී - කමිටු සාමාජික
- එම්.ඉන්ද්‍රශාන්ත මහතා - කාර්මික නිලධාරී - කමිටු සාමාජික
- අමානි සුගතදාස මහත්මිය - කළමනාකරණ සේවා නිලධාරී - කමිටු සාමාජික
- තිළිණි ප්‍රියංගිකා මහත්මිය - ආදායම් පරීක්ෂක - කමිටු සාමාජික
- නිරෝෂා සමරතුංග මහත්මිය - පුස්තකාල සහයක - කමිටු සාමාජික
- ප්‍රජා සංවර්ධන නිලධාරී - පළාත් පාලන කොමසාරිස් කාර්යාලය

**06.කාරක සභාවල වාර්තා**

2021.12.30 දිනැති මුදල් කාරක සභා වාර්තාව අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී අකිල රෝෂන් ලක්මාල් මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත කරන ලදී.

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

මාසික ආදායම් හා වියදම් සාරාංශ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

**08.ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා ගරු මන්ත්‍රීතුමියන්ලාගේ කතා**

**i. ගරු මන්ත්‍රී අඛිල රෝෂන් ලක්මාල් මහතා**

බටේවෙල කොට්ඨාශයේ හෙට්ටිකන්ද ග්‍රාම නිලධාරී වසමේ පෙරපාසල් දෙකක් තිබූ බවද, ඒවා දැනට වැසී ගොස් ඇති බවත්, අලුතින් පෙර පාසැළක් අරම්භ කිරීම සඳහා ඩිප්ලෝමාධාරී ගුරුවරියක ඉදිරිපත්වී ලියාපදිංචි කර ගැනීම සඳහා කටයුතු කිරීමේදී අලුතින් පෙරපාසැල් ලියාපදිංචි නොකරන ලෙසට මධ්‍යම රජයෙන් නිකුත් කර ඇති චක්‍රෙල්ඛනයක් අනුව දන්වා ඇත. ඒ අනුව කොට්ඨාශය සඳහා අත්‍යවශ්‍යව ඇති පෙරපැසලේ අවශ්‍යතාවය ඉටුකරගතනොහැකි තත්වයට පත්ව ඇති බවත්, මෙම වසරේ ළමුන් 25 දෙනෙකු පමණ පෙර පාසැල් වයසේ ගමේ සිටින බවත්, ඔවුන් බොහෝ දුරක් ගෙවා වෙනත් පෙර පාසැල් සඳහා යොමු කළයුතු තත්වයක් ඇති වී ඇති අතර, මේ හේතුවෙන් දෙමාපියන්ද අසීරු තත්වයට පත්ව ඇති බව එතුමා පෙන්වා දුන්නේය. මේ පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කර විසඳුමක් ලබාදීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

**ii. ගරු මන්ත්‍රී ඩික්සන් ජයතිලක මහතා**

කහංගම කොට්ඨාශයට අයත් කඳනවෙල ක්‍රීඩා පිටිය මේ දිනවල සුද්ද කිරීමේ කටයුතු සිදුකරගෙන යනව,නමුත් ඊට විරෝධය පාමින් පිරිසක් මේ වන විට ඉදිරිපත් වී ඇති බවත්, රත්නපුර ප්‍රාදේශීය සභාවට අයත් විශාලතම ක්‍රීඩාපිටිය මෙය බවත්, එය ආරක්ෂා කර ගතයුතු බවත්, එතුමා පෙන්වා දුන්නේය. මෙම භූමියේ පදිංචි වී සිටි අයට වන්දියක් ගෙවීමට නඩුවකින් තීරණය කර ඇති බැවින් , එසේ ගෙවීමට ඇති මුදල් විශාල මුදලක් නොවන බවත්, එම මුදල් ගමේ තරුණ පිරිස විසින් එකතු කර දීමට පවා කැමැත්තෙන් සිටින බැවින් මෙම ක්‍රිඩා පිටිය ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස ගරු සභාපතිතුමාගෙන්ඉල්ලීමක් කළේය.

**iii.ගරු මන්ත්‍රී රෝහාන් ශ්‍රියන්ත මහතා**

තම කොට්ඨාශයේ ගල්කඳුර කොටසේ පිහිටා ඇති කෝවිලේ පූජක තුමා ගේ නිවසට අවහිරතාවයක් දක්වන කොස් ගසක් ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් කීප අවස්ථාවක සභාවේදී කතා කළ බවත්, එහෙත් මේ වන විටත්, එම ගැටළුවට විසඳුමක් ලැබී නොමැති බවත්, ගරු මන්ත්‍රීවරයා ප්‍රකාශ කළේය. මේ පිළිබඳව අවධානය යොමුකර ගැටළුවට විසඳුමක් ලබා දීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

2022 ක්‍රියාකාරී සැළැස්ම තුළ ප්‍රදේශයේ ජනතාවගේ සනීපාරක්ෂක කටයුතු හා ජල ව්‍යාපෘති සම්බන්ධව කටයුතු කරන බව සඳහන් වෙනවා. මෙම කටයුතු පසුගිය වසර හතර තුළ සිදුවී ඇත්ද යන්න පසු විපරම් කිරීම කළයුතු බවත්, මෙම සභාව තුළින් ප්‍රදේශයේ ජනතාවට මේ වසර හතර ඇතුළත සිදුවි ඇති සේවය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බව එතුමා පැවසුවේය. තම කොට්ඨාශයේ ජනතාවට සාධාරණයක් සිදුකිරීමට තමන් රත්නපුර ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරයෙකු ලෙස පත්වී පැමිණීම තුළින් සිදු නොවුනු බව පැවසූ ගරු මන්ත්‍රීවරයා වැඩි දුරටත් කියා සිටියේ මෙම ප්‍රාදේශිය සභාවට පත්වී ඇති සියළුම මන්ත්‍රීවරුන්ට එකසේ කටයුතු කිරීමේ හැකියාව ඇති බවත්, සියළුම දෙනා පැමිණ ඇත්තේ ජනතා සේවය උදෙසා පමණක් බවත්ය, එහෙත් මෙම සභාව තුළ විපක්ෂයේ මන්ත්‍රිවරුන්ගේ අදහස් හා යෝජනා පිළිබඳව කිසිදු තැකීමක් නොකරන බව එතුමා පැවසුවේය. තමන් සභාවේදී කතා කරනු ලබන්නේ ජනතාවගේ අවශ්‍යතා මිස තමන්ට පුද්ගලිකව අවශ්‍ය දේ නොවන බවද පැවසු ගරු මන්ත්‍රීවරයා කියා සිටියේ ජනතාව තම සේවය වෙනුවෙන් අසංතෘප්තව ඇත්නම් එය තමන්ට බලපෑමක් ඇති කරන බවත්, පක්ෂයේ නායකයාටවත්, දිස්ත්‍රික් නායකයාටවත් එය බලපෑමක් ඇති නොකරනු ලබන බවත්ය. එබැවින් සභාව මගින් සිදුවන සෑම ක්‍රියාවක් පිළිබඳව අවධානය යොමු කළයුතු බවත්,එහිදී සිදුවනු ක්‍රියාවන් සම්බන්ධව තමන්ගේ මතයට අනුව ප්‍රගතිය බිංදුව බව එතුමා පැවසුවේය.

අපි පුද්ගල මතවාද පිළිබඳව නොවෙයි අදහස් ඉදිරිපත් කරන්නේ ප්‍රතිපත්තිමය මතවාද වෙනුවෙනුයි අපි ගැටීම් ඇති කර ගන්නේ 2022 වසරේ අයවැය විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් නොවුණු බව පැවසූ ගරු මන්ත්‍රීවරයා කියා සිටියේ සභා බල ප්‍රදේශයේ යම්කිසි සංවර්ධනයක් සිදුවන්නේනම් එය ආදායම් උත්පාදන මාර්ගයන් තුළින් උපයන ආදයමෙන් හෝ මහජනතාව ගෙවන බදු මුදලින් ක්‍රියාත්මක විය යුතු බවයි. එසේ නොමැතිව වෙනත් රටකින් හිඟා කා ගත් ආධාර මුදලක් වැය කිරීම තුළින් සංවර්ධනයක් සිදු නොවන බව එතුමා පැවසුවේය. ප්‍රදේශයේ යම්කිසි පුද්ගලයෙකු ආදායම් බදු ගෙවීම සඳහා පෙළඹීමක් නොමැත්තේ ඇයිද යන්න සොය බැලිය යුතු බවත්, ඒ සඳහා පෙළඹීමක් ඇතිවන ආකාරයට කටයුතු කිරීමට පළාත් පාලන ආයතනය තුළින් ගත් ක්‍රියාමාර්ග මොනවාද යන්න පිළිබඳව අවධානය යොමු කලයුතු බවද එතුමා පැවසුවේය.

තමන් පත්කළ ජනතාව වෙනුවෙන් සාධාරණයක් ඉටුකිරීම සඳහා ඉදිරි කාලය තුළදීවත් ගරු සභාපතිතුමා විසින් ලබා ගන්නා ප්‍රතිපත්තිමය තීරණ වලට තමන්ගේ සහය ලබාදීමට කටයුතු කරන බව එතුමා සඳහන් කළේය.

**iv.ගරු මන්ත්‍රී ගෝපාල් තම්බිරාජා මහතා**

හපුගසුතැන්න වතුයායේ LOC සමාගම යටතට ගත් පසු කම්කරුවන්ට අසාධාරණයක් සිදුවී ඇති බවත්, මේ අයුරින් කම්කරුවන් වෙත සිදුවන අසාධාරණකම්වෙනුවෙන් පාරට බැසීමට ජනතාව පත්කරන ලද මන්ත්‍රීවරයෙකු ලෙස තමන්ට සිදුවන බවත්, මෙම සමාගම තුළින් සිදුවන අසාධාරණකම් පිළිබඳව සොයබලා විසඳුමක් ලබාදෙන ලෙස එතුමා ඉල්ලා සිටියේය.

වේවැල්වත්ත පොලීසියේ නවතා තිබූ 1990 ඇම්බියුලන්ස් රථය මේ වන විට රත්ගහ පන්සලේ නතර කර තිබෙනවා එය වතු ජනතාවට හදිසි අවස්ථාවකදී ලබා ගැනීම සඳහා රෝහලට ආසන්න ප්‍රදේශයක ස්ථාගත කරන්නේනම් සුදුසු බව එතුමා පැවසුවේය.

හපුගස්තැන්න රෝහල සඳහා වත්තෙන් අක්කර දෙකක පමණ කොටස අනුමත් වී තිබෙනවා මේ අවස්ථාවේදී වතු සමංගම්වල බලධාරීන්ද කැමැත්ත ප්‍රකාශ කර ඇති අවස්ථාවේදී මැණුම් කටයුතු කඩිනම් කර ගැනීම සුදුසු බව එතුමා සඳහන් කළ අතර, රෝහලේ වැසිකිළිය අබලන් වී ඇති නිසා එය ද පිළිසකර කර දීමට කටයුතු කළයුතු බව එතුමා සඳහන් කළේය.

**v.ගරු මන්ත්‍රී කමනි සේනාධීර මහත්මිය**

පළාත් පාලන අමාත්‍යංශය මගින් දැනුම් දීමක් කර තිබුණා ළමා හා කාන්තා ආරක්ෂිත කමිටු ග්‍රාමීය වශයෙන් පිහිටුවන ලෙසට එම කමිටු පිහිටුවා මේ වන විට රැස්වීම් වාර දෙකක් පමණ පවත්වා තිබෙනවා. මෙම කමිටුවල ඉලක්කගතවූ වූයේ අසාධාරණයට ලක්ව ඇති කාන්තාවන් හා ළමුන් සිටින නිවාස බවත්, එතුමිය පැහිදිලි කළ අතර, මෙම කමිටු විධිමත්ව ඉදිරියට මේ වසර තුළ ක්‍රියාත්මක කරගෙනයාමට අවශ්‍ය සහයෝගය ලබාදෙන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටියේය.

**vi.ගරු මන්ත්‍රී ඉන්දික ලක්ෂ්මන් මහතා**

1990 ගිලන් රථ සේවය වේවැල්වත්ත ප්‍රදේශයේ ස්ථානගත කළයුතු බව එතුමා සඳහන් කළේය. තම්බිරාජා මන්ත්‍රීතුමා කතා කළා වගේ වතුකරයේ ඇති වී තිබෙන ගැටළුවට විසඳුමක් ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙසද ගරු මන්ත්‍රීවරයා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කළේය.

වේවැල්වත්තමාර්ගයේ ධාවනය වන පුද්ගලික හා ලංගම බස්රථ සේවාව සම්බන්ධව මීට පෙරත් කතා කළ බවත්, මෙම බස් රථ පැය භාගයකටත් වඩා ප්‍රමාද වන වන බවත්, ඒ තුළින් මගී ජනතාවගේ කාලය නිකරුනේ නාස්තිවීමෙන් ඉන්ධන ටික අපතේ යනවා වැනි ගැටළුකාරී තත්වයන්ට මුහුණපෑමට සිදුව ඇති බවත් ඒ සඳහා විසඳුමක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරදෙන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

එගස්ලෑන්ඩ් වත්තේ වැසිකිළි සියල්ලම පිරී තිබෙනවා මෙය ගලි බවුසරයක් අධාරයෙන් බැහැරකර දී එම ජනතාවට ජිවත්වීමට සුදුසු පරිසරයක් සකස්කර දෙන ලෙසත්, ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කළේය.

**vii. ගරු මන්ත්‍රී අනූෂ විරාජ් මහතා**

හෙට්ටිකන්ද ගමේ පෙරපාසැළ සම්බන්ධව අඛිල මන්ත්‍රි තුමා සඳන් කළා වගේ එම පෙරපාසැළ ආරම්භ කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කළේය.

2022 අයවැයට ඡන්දය ලබාදීම සම්බන්ධව විවිධ මතවාද ඉදිරිපත් කරනවා ඇතැමුන් නමුත් කොන්ද කෙළින් තියාගෙන කටයුතු කළ බවත්,තම පක්ෂයේ ඉහළ නායකත්වයන් එරෙහි වූත් ඒ අවස්ථාවේදී තමන් විසින් ලබාගත් තීරණය කිසිම අයුරකින් වෙනස් නොකළ බවත්, තම කණ්ඩායමත් හසුරුවාගෙන ඊට අවශ්‍ය සහය එල කළ බව එතුමා සඳහන් කළේය.

පළාත් පාලන ආයතනයන්හි වසරකින් කාලය දීර්ඝ කරමින් තම මන්ත්‍රීධුර තවත් වසරක් ක්‍රියාත්මක කිරීමට ඉඩ සළසා දුන් ගරු ජනාධිපතිතුමා වෙත තම ස්තූතිය එල කළේය.

**viii.ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතා**

සියළුම දෙනාට කිරියෙන් පැණියෙන් බත බුලතින් සපිරුණු සුභ නව වසරක්වේවායි ගරු මන්ත්‍රීවරයා පැවසුවේය. 2022 අයවැය පිළිබඳව නැවත කතා කළයුතු නොමැති බවත්, එය සම්මත වී අවසන් බවත් එතුමා පැවසුවේය. ධනාත්මක චින්තනය පිළිබඳව දේශන පවත්වමින් මේ රටට පමණක් නොව විදේශීය රටවල පවා කීර්තිමත් දේශකයකු වන චන්දන ගුණවර්ධන මහතා අප ප්‍රදේශයේ දෙහෙන කන්ද ප්‍රදේශයේ උපත ලද කෙනෙකු ලෙස අපට මහත් ගෞරවයක් වන බවත් එතුමාගේ අභාවය පිළිබඳව මේ අවස්ථාවේදී ශෝකය ප්‍රකාශ කර සිටින බවත්, එතුමා පැවසුවේය.

නාලන්ද එල්ලාවල මැතිතුමා අභාවප්‍රාප්ත වෙලා අවුරුදු විසි පහක් පමණ වන බවත්, ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ලෙස රත්නපුර පිළිබඳව ඔහු උනන්දු වූ ආකාරය පිළිබඳව සිහිපත් කරදුන් මන්ත්‍රීවරයා කියා සිටියේ ඔහු අද වන විට සිටියානම් රත්නපුර ප්‍රදේශය සංවර්ධනය වන ආකාරය පිළිබඳව දැකගන්නට තිබූ බවයි. රොහාන් මන්ත්‍රීතුමා සඳහන් කරන ලද සංවර්ධන කටයුතු සිදුකර ගැනීම සඳහා මෙවර ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා විසින් කොට්ඨාශයට මුදල් වෙන්කර දී තිබෙනවා ඒ තුළින් තම කොට්ඨාශයේ සංවර්ධන කටයුතු සිදුකර ගැනීමේ හැකියාවක් ඇති බව එතුමා පෙන්වා දුන්නේය.

තම ආණ්ඩුවෙන් සිදුකරන සංවර්ධන ක්‍රියාදාමයන් සිදුකරන්නේ පක්ෂ පාට භේදයකින් තොරව බවත්, මේ රට තුල ජීවත්වන සියළුම ජනතාවට එකසේ සංවර්ධනයේ ප්‍රතිඵල බෙදී යා යුතු බව එතුමා පෙන්වා දුන්නේය.

සභා රැස්වීමට පැමිණෙන අවස්ථාවේදී නියමිත ඇඳුමක් ඇඳගෙන පැමිණීම කළ යුතු බවත්, සභාවේ ගරුත්වය ආරක්ෂා වන පරිදි සියළුම මන්ත්‍රීවරු කටයුතු කළයුතු බව එතුමා සඳහන් කළේය. මන්ත්‍රීවරයෙකු පිට පිට අවස්ථා තුනකදී මහා සභාවට නොපැමිණියේනම් ඔහුගේ මන්ත්‍රීධුරය අහෝසි වන බවත්, නමුත් පළාත් පාලන අමාත්‍යවරයාට හැකියාව තිබුනා නැවත ඔහු එම ධුරයේ පිහිටුවීමට නමුත් මේ මෑතකදී එම සහනයද අහෝසි වුනා ඒ අයුරින් ගත් ක්‍රියාමාර්ගයද යහපත් බව එතුමා පැවසුවේය.

ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රී අනුර ප්‍රභාත් මහතාගේ පියාලේ අභාවයට තමන්ට සහභාගී වීමට නොහැකි වූ බවත් මේඅවස්ථාවේදී ඒ වෙනුවෙන් සියළුම මන්ත්‍රීවරුන් වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාවක් කරලන්නා බව පැවසූ ගරු මන්ත්‍රීවරයා සියළුම දෙනාට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් තම අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරන ලදී.

**ix. ගරු මන්ත්‍රී නාලක සුදත් ශ්‍රී හේමපාල මහතා**

එක්සත් ජාතික පක්ෂය අද විශාල කනගාටුවකට පත්ව ඇති බවත්, ඒ පිළිබඳ සිදුකළ කතාවලින් පැහැදිළි වූ බව මන්ත්‍රිවරයා පැවසුවේය. අදහස් ප්‍රකාශ කර විවේචනයන් කර ඒවාට පිළිතුරු ලබාදීමට ප්‍රථම සභාවෙන් ඉවත් වී යන බව පැවසූ ගරු මන්ත්‍රීවරයා පවසා සිටියේ දීමනාව ගැනීම පිළිබඳව ලැජ්ජා වන බව පවසන ඔවුන්ම සභාවෙන් වේලාසන පිට වී යාම පිළිබඳව ලැජ්ජා විය යුතු බවයි. සභා වාර්තාවට ලොකු කතන්දර ටිකක් කියලා එය එළියට ගොස් ජනතාවට පෙන්වීම නොවෙයි කළ යුත්තේ දීර්ඝ කරන ලද ඉදිරි වසරේදී හෝ එක්ව කටයුතු කරමුයැයි ගරු මන්ත්‍රිවරයා පැවසුවේය. එසේම අනුර මන්ත්‍රීතුමාගේ පියාණන්ගේ අභාවය පිළිබඳව තම ශෝකය එල කර සිටින බවත් එතුමා පැවසුවේය.

**x.ගරු මන්ත්‍රී පත්මා නන්දනී මහත්මිය.**

දෙපාර්ශවයකට වෙලා කැකෝ ගැසීම තමන් අනුමත නොකරන බවත්, දේශපාලන කුහකත්වයකින් කතා නොකල ජනතාවගේ ගැටළු හා ඒවාට විසඳුම් ලබාදීම පිළිබඳව කථා කළ යුතු බව ගරු මන්ත්‍රීතුමිය පැවසුවාය. නවක මන්ත්‍රීවරුන් ලෙස ප්‍රාදේශීය සභාවේ කටයුතු පිළිබඳව අනපනත් පිළිබඳව අවබෝධයක් නොතිබූ බවත්, නමුත් මේ වන විට ප්‍රාදේශිය සභාවෙන් ඉටුවිය යුතු දේ පිළිබඳව අවබෝධයක් ඇති බැවින් මෙවර අයවැය සඳහා තම විරෝධය ප්‍රකාශ කර සිටි බවත් එතුමිය පැවසුවාය.

සභා වාර කිහිපයකදිම බල ප්‍රෙද්ශයට අයත් සුසාන භූමි පිළිබදවත්, ක්‍රීඩා පිටි පිළිබඳවත් ඒව මැණුම් කර විධිමත් ලෙස පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරදෙන ලෙස ඉල්ලා සිටි නමුත් , අද වන තෙක් ඒවා ක්‍රියාත්මක නොවූ බව එතුමිය සඳහන් කළාය.

වේවැල්කැටිය වතුරෝහල සුදු අධිරාජ්‍ය කාලයේ සිට අවුරුදු එකසිය ගානකට නැකම් කියන අතර, ඇම්බියුලන්ස් එකක් තිබුනා ,වාට්ටු තිබුණා මාතෘ නිවාස තිබුණා අද වන විට නැත්තටම නැතිවෙලා තිබෙනවා සායන දෙක තුනක් පමණක් තිබෙන බවත් වතු රෝහල බේරාදෙන ලෙසට ගරු මන්ත්‍රිතුමිය ඉල්ලීමක් කළාය.

දෙහෙනකන්ද සිට නුගේපොල දක්වා මාර්ගය අතිශයින්ම අබලන් තත්වයකට පත්ව ඇති බවත්, විශාල වශයෙන් දැව කපා මාර්ගයේ ලොරිවලින් අදිනවා. ඒ සඳහා විදසඳුමක් ලබාදෙන ලෙස එතුමිය ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

මුක්කුවත්ත ප්‍රදේශයේ ව්‍යාපෘතියක් සිදුකරගෙන යනවා එයින් ලබාලන්නා ජලය පිටපළාත් වලට තමයි ගෙනියන්නේ, ව්‍යාපෘතියක් සිදුකිරීමේදී නියමයක් තිබෙනවා එය පිහිටි ප්‍රදේශයට යම්කිසි ප්‍රතිලාභයක් හිමිවිය යුතු බවට නමුත් ඒ කිසිවක් නොමැතිවයි මෙය සිදුකරන්නේ මා දන්නා තරමින් මේ පිළිබඳව සොයා බලා තොරතුරක් ලබාදෙන ලෙස එතුමිය පැවසුවාය.

මේ වසරේදී ඉදිරිපත් කළේ හතරවැනි අයවැයයි අපිත් සමානුපාතිකව ඡන්දයෙන් පත්වුණු අය බව දැනගෙන තමයි මෙහි වාඩි වී සිටින්නේ .විපක්ෂයේ මන්ත්‍රීවරුන් වෙනුවෙන් කුමක්ද කළේ යන්න තම හෘර්ද සාක්ෂියට අනුව සිතාබලන ලෙස ගරු සභාපතිතුමාට පැවසුවාය. තමන්ලා සභාවට ගොස් ජනතාව වෙනුවෙන් කරන්නේ කුමක්ද යන්න ජනතාව විමසා සිටින බවත් එතුමිය පැවසුවාය. පක්ෂ හෝ විපක්ෂ මන්ත්‍රීවරුන් සියළුම දෙනා පැමිණ සිටින්නේ එකම කාරණයක් උදෙසා බවත්, 2022 වසරේ වත් යම්කිසි ව්‍යාපෘතියක් හෝ ලබාදෙන ලෙසත්, වීථි ලාම්පු කිහිපයක් හෝ ලබාදෙන ලෙසත් එතුමිය ඉල්ලා සිටියාය.

පොහොර නොමැති වීම නිසා තේ වගාව සම්පූර්නයෙන් ම විනාශ වී හමාර බවත්, ප්‍රේමදාස මහතාට දොස් කිව්වත් එතුමා ආරම්භ කළ ඇගලුම් කම්හල් හේතුවෙන් තමයි අද වන විට විදේශ විනිමය යමතාක් දුරට හෝ ලැබෙනවා නම් ලැබෙන්නේ. විදේශ විනිමය ලැබෙන ප්‍රධාන මාර්ගයක් වන තේ වලාව මුලින්ම විනාශ කරගත්තා. අනතුරුව සංචාරක ව්‍යාපාරයෙන් තමයි විදේශ විනිමය ලැබෙන්නේ . අදවන විට රට විශාල ආර්ථික අර්බුදයකට පත්ව ඇති බවත් ගරු මන්ත්‍රී හර්ෂද සිල්වා මහතා ආරම්භ කරන ලද ගිලන් රථ සේවාවතුළින් අද වන විට විශාල සේවාවක් සිදුවී ඇතැයිද එතුමිය පැවසුවාය.

රජයේ සේවකයින්ගේ රුපියල් දෙළොස්දහසක් වැනි ප්‍රමාණයක වැටුප් වැඩි වීමක් සිදුකලේ ගරු රනිල් වික්‍රම සිංහ මැතිතුමා බවද එතුමිය සඳහන් කළාය.

දෙහෙන කන්ද පාසැළ වැසීයෑමේ තර්ජනයට ලක්ව ඇති බවත්, මේ සඳහා හේතු වී ඇත්තේ බොහෝ පිරිසක් ගම හැරදා යෑම බව එතුමිය පැවසුවේය. ගමේ සිටින දුප්පත් පිරිසට පාසැළ අහිමි වීම සිදුවන බව ත් එතුමිය වැඩිදුරටත් සඳහන් කළාය.

දෙහෙන කන්ද විද්‍යාලයෙන් අධ්‍යාපනය ලද දුෂ්කර ගමනක් ගිය ධනාත්මක චින්තන උපදේශක චන්දන ගුණවර්ධනයන්ගේ නික්මයාම පිළිබඳව ගමේ ජනතාව වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කර සිටින බවද එතුමිය පැවසුවාය.

### Xi .ගරු උප සභාපතිතුමා

රත්නපුර ප්‍රාදේශිය සභා බල සීමාවට අළුතින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයෙක් පැමිණ ඇති බවත්, එතුමා මානුෂිය ගුණාංගයන්ගෙන් පිරුණු පුද්ගලයෙක් බව ගරු උප සභාපතිතුමා පැවසුවේය. නොදරන කසළ ප්‍රශ්ණය ඉතාමත්ම උඩුදුවා ඇති ප්‍රශ්නයක් නිසා මේ පිළිබඳව ස්ථිර විසඳුමක් ලබා දීමට අවශ්‍ය කටයුතු කළයුතු බව එතුමා පැවසුවේය. අප ප්‍රෙද්ශයේ කවුරුන් හෝ දවසකට කොනෙකු කතා කරනවා ගලි බවුසරයක අවශ්‍යතාවයට ඒ නිසා රත්නපුර ප්‍රාදේශිය සභාවෙන් මෙම සේවාව ලබා දීම සඳහා වැඩපිළිවෙළක් සකස් කළයුතුයැයි ගරු සභාපතිතුමා පැවසුවේය.

ප්‍රිමික්ස් යාර්ඩ් එක කසළ එකතු කිරීම සඳහා යොදාගෙන ඇති බවත්, ප්‍රිමික්ස් අංගනය නැවතත් ආරම්භ කළහොත් ප්‍රාදේශිය මාර්ග නඩත්තු කිරීමට අවශ්‍ය ප්‍රිමික්ස් යොදාගෙන කටයුතු කළ හැකි බව එතුමා පැවසුවේය. කඩිනමින් මෙම ප්‍රිමික්ස් අංගනය ආරම්භ කිරීමට ගරු සභාපතිතුමාගේ අවධානය යෙමුකරන ලෙස එතුමා ඉල්ලීමක් කළේය.

විසල් ජල යෝජනා ක්‍රමය නිසා මාර්ග කිහිපයක් විශාල වශයෙන් කැඩීයාමට ලක් ඇති බවත්, ප්‍රාදේශිය සභාවේ කාර්මික නිලධාරිවරයා හෝ යොදවා පරීක්ෂා කර බලා එම මාර්ග පිළිසකර කර ගැනීමට අවශ්‍ය කටයුතු කළයුතු බව එතුමා පැවසුවේය.

සියළුම දෙනාගේම අවධානය යොමු කළයුතු කාරණාවත් තමයි නීති විරෝධි මත්ද්‍රව්‍ය , මත්කුඩු, මත්පෙති විශාල වශයෙන් ප්‍රදේශ ආක්‍රමණය කර ඇති බවත්, මෙම වුවදුර විනාශ නොකළහොත් මහත් ව්‍යසනයක් තරුණ පරපුරට සිදුවන බව එතුමා පැවසුවේය. මේ පිළිබඳව පොලීසිය හා සමඟ සාකච්ඡාවක් සිදුකර වැඩපිළිවෙලක් සැකසිය යුතු බව එතුමා පැවසුවේය.

පාසැළක් වහනවා යනු සිර ගෙයක් ඇරෙනවා යන්න ගරු උප සභාපතිතුමා පැවසු අතර, මලංකන්ද විද්‍යාලය වැසී යෑමේ තර්ජනයට ලක්ව ඇති අවස්ථාවේදී තමන් මැදිහත් වී එය වැළැක් වූ බව එතුමා පැවසුවේය. පත්මා නන්දනි මන්ත්‍රීතුමිය පැවසු පරිදි දෙහෙන කන්ද විද්‍යාලය වැසී යාමට ඉඩ නොදී ආරක්ෂා කර ගතයුතු බවද එතුමා සඳහන් කළේය.

### Xii.ගරු සභාපතිතුමා

ගරු රොහාන් මන්ත්‍රීතුමා කියන දේ කුමක්ද යන්න වෙනමම පැහැදිලි කරගත යුතු බව ගරු සභාපතිතුමා පැවසුවේය.එතුමා කියන පරිදි 1948 සිට මේ දක්වා සිදුකරන ක්‍රියාවන් තුළින් රටේ දියුණුවක් ඇති වූයේ නම් අදවන විට පළාත් පාලන ආයතන, පළාත් සභා නොවෙයි පාර්ලිමේන්තුවද අවශ්‍ය නොවන බව එතුමා පැවසුවේය. අඩුපාඩු පමණක් කතා කරකර නොසිට සභා බල ප්‍රදේශයට සිදුකළ යුතු කටයුතු සිදුකර ඇති බවත්, එය තමන්ගේ හඳවතට අනුව සතුටට පත්විය හැකි බවත්, ගරු සභාපතිතුමා පැවසුවේය.

කසළ අංගනයක් ඉදිකිරීම සඳහා ඉඩමක් ලබා ගැනීම සඳහා කටයුතු කරන බවත්, එය පහසු කාර්යයක් නොවන බවත් එතුමා පැවසුවේය. සුසානභූමි , ක්‍රීඩා පිටි සියල්ල පවරා ගැනීමට අවශ්‍ය කටයුතු 90%ක් පමණ මේ වන විට අවසන්ව ඇති බව ගරු සභාපතිතුමා පැවසුවේය.

සැළසුම් කරන ලද ප්‍රධාන කාරණා කිහිපයක් මෙම කොරෝනා ගැටළුව නිසා මගහැරී ගිය බවත්, මේ වසරේදි ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත්, එතුමා පැවසුවේය.

රොහාන් මන්ත්‍රීතුමාටත්, බෝතුංග මන්ත්‍රීතුමාටත් මහා හිත් රිදීමක් ඇතිවෙලා තිබෙව බව පේනවා. මෙවැනි අය සමඟ කණ්ඩායම්ගතව සිටින නවක මන්ත්‍රීවරුන්ට කියා සිටින්නේ ප්‍රවේශමෙන් කටයතු කරන ලෙසත්, මගේ කණ්ඩායම පාලනය කරගනිමින් ඔවුන්ගේ එකමුතුකම ආරක්ෂා කර ගනිමින් ඉදිරියේදී ත් කටයුතු කරන බව එතුමා සඳහන් කළේය.චන්දන ගුණවර්ධනයන්ගේ හා ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රී අනුර ප්‍රභාත් මහත්ගේ පියාණන්ගේ අභාවය වෙනුවෙන්ද තම ශෝකය ප්‍රකාශ කර සිටින බව පැවසුවේය.

අද දින මහා සභාවට පැමිණි සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාටත් තුමියන්ලාටත්, ලේකම් තුමා ඇතුළු කාර්යය මණ්ඩලයේ සියළුම දෙනාටත් ස්තූතිවන්ත වෙමින් සභාවේ කටයුතු ගරු සභාපතිතුමා විසින් අවසන් කරන ලදී.

**ඩබ්ලිව්.ඩී.සුදත් දිසානායක**
**සභාපති**
**රත්නපුර ප්‍රාදේශිය සභාව**